**ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය, නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 20 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.4 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි** | **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම. | 2.2.1 |
| | | 2. | අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.3 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | | වත්කම් කළමනාකරයේ අඩුපාඩු | 2.2 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 2.2 වත්කම් කළමනාකරණය

**වත්කම් ලේඛනගත කිරීම**

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර ඇති වත්කම් වටිනාකම හා විසර්ජන ගිණුමේ ඩීජීඑස්ජ් (1) ආකෘතියේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ දක්වා ඇති වටිනාකම අතර රු. 2,871,149 ක වෙනසක් පැවතුණි. 2008 වර්ෂයේ සිට නිරවුල් නොවූ ශේෂයන් දිගින් දිගටම විසර්ජන ගිණුමට ඇතුළත්ව පවතින බවත් කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත වාර්තා කර ඇත්තේ භෞතිකව හඳුනාගෙන ඇති වත්කම්වල වටිනාකම් පමණක් බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

### 2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා සමාලෝචිත වර්ෂයේ තොරතුරුවලට අදාළ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 13.465 | 12.847 | 0.618 | 4.59 |
| | මූලධන | 0.900 | 0.358 | 0.542 | 60.22 |
| | **එකතුව** | **14.365** | **13.205** | **1.160** | **8.08** |
| 2014 | පුනරාවර්තන | 17.530 | 17.168 | 0.362 | 2.07 |
| | මූලධන | 0.650 | 0.281 | 0.369 | 56.77 |
| | **එකතුව** | **18.180** | **17.449** | **0.731** | **4.02** |
| 2015 | පුනරාවර්තන | 19.035 | 11.087 | 7.948 | 41.75 |
| | මූලධන | 1.065 | 0.798 | 0.267 | 25.07 |
| | **එකතුව** | **20.100** | **11.885** | **8.215** | **40.87** |
| 2016 | පුනරාවර්තන | 9.970 | 9.632 | 0.338 | 3.39 |
| | මූලධන | 0.680 | 0.646 | 0.034 | 5.00 |
| | **එකතුව** | **10.650** | **10.278** | **0.372** | **3.49** |
| 2017 | පුනරාවර්තන | 10.238 | 8.931 | 1.307 | 12.77 |
| | මූලධන | 0.900 | 0.130 | 0.770 | 85.55 |
| | **එකතුව** | **11.138** | **9.061** | **2.077** | **18.65** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 1.15 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 0.88 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ඉතිරිය එම වැය විෂයයන් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.4 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 7.046 ක් වැයකර තිබුණි. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල පඩිනඩි වියදම රු.587,167 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 04 | 10 |
| (ii) | තෘතීය මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 05 | 04 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 05 | 04 | 01 |
| | **එකතුව** | **25** | **12** | **13** |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) **අවශ්‍යතාවය ඉක්මවා කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම**

-------------------------------------------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ඇගයීමකට අනුව 2018 මැයි 21 දින සිට කාර්ය මණ්ඩල සංශෝධන සිදු කරන ලද බවත් ඒ අනුව මුළු කාර්ය මණ්ඩලය 19 ක් දක්වා අඩුකරගෙන ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(ආ) **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

--------------------------------

(i) කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් පැවතියද දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් තුන්දෙනෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 08 ක හෝ පුහුණුවක් ලබා දී නොතිබුණි.

(ii) පසුගිය වර්ෂ 05 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා එකතුව රු.1,415,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් එකතුව රු.766,718 ක් උපයෝජනය කර තිබුණි. 2013 වර්ෂයේදී පුහුණු කිරීම් සඳහා ප්‍රතිපාදිත මුළු මුදලම උපයෝජනය කර නොතිබුණු අතර, 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් සියයට 50 ක් හා සියයට 51 ක් පමණක් උපයෝජනය කර තිබුණි. 2012 වර්ෂයේදී අදාළ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේද සියයට 33 ක් පමණක් උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය.